
# 1

# නව දැක්මක් කරා .......

## මෙසියස් වහන්සේ

❖ **චිත්‍රමය ආකාරය :**




❖ **වචන පැහැදිලි කිරීම :**


| | |
|---|---|
| මෙසියස්/ මෙසායා | " ආලේපලත් තැනැත්තා" යන අරුත ඇති හෙබ්‍රෙව් වචනයකි. |
| ක්‍රිස්තුස්/ ක්‍රිස්ටොාස් | ඉහත හෙබ්‍රෙව් වචනයේ ග්‍රීක පරිවර්තනය යි. |
| එම්මානුවෙල් | " දෙවියන් වහන්සේ අප සමඟ යි." අරුත් ඇති හෙබ්‍රෙව් වචනයකි. |

❖ **පසුබිම/ සංදර්භය :**

පුරාණ ගිවිසුම තුළ විශේෂ අවස්ථාවන්හි දී ආලේප කරනු ලැබීම සිදු වී ඇත.
දිවැසිවරයකු පූජකවරයකු හෝ රජකු තම මෙහෙවර අරඹන්නේ ආලේපය ලැබීමත් සමඟ ය. දිවැසිවරයා ( හෙබ්‍රෙව් = නවී ) දෙවියන් වහන්සේගේ වචනය මිනිසුන් වෙතට ගෙන එයි.
පූජකයා මිනිසුන්ගේ යැදුම් දෙවියන් වහන්සේ වෙතට ගෙන යයි. විවිධ අවස්ථාවල එඩේරකු ලෙස ජනතාවට මඟ පෙන්වයි.
රජතුමාගේ කාර්යභාරය වූයේ දෙවියන් වහන්සේගේ නියෝජිතයකු ලෙස යහපත් පාලනය සිදු කිරීම යි. ව්‍යවස්ථාව (ටෝරා) මත තම තීරණය පදනම් කර ගනී.
( උදා. ද්වීතිය කථාව 17:1420)
යේසුස් වහන්සේ විසින් සම්පූර්ණ කරන ලද

- දිවැසිවර
- පූජක
- රජ

යන ආකෘති තුන පිළිබඳ ව චිත්‍ර මෙහි දැක්වේ.


දිවැසිවරයා
පූජකයා
රජතුමා
ඊශ්‍රායෙල් ජනතාව

පහත කොටස් කියවීමෙන් ඉහත දැක්වූ කොටස් තුනට අයත් අය ආලේප කළ අවස්ථාව වටහා ගන්න.

- පූජකයා (නික්ම යාම 29:7, ලෙවී කථාව 4:35 )
- රජතුමා (1සාමුවෙල් 10:1, 16:13, 24:6, 2 සාමුවෙල් 2:4)
- දිවැසිවරයා (1 රාජාවලිය 19 :16)


මෙකී අවස්ථා තුනට අමතර ව යෙසාය 45:1 දැක්වෙන ලෙස සයිරස් නම් පර්සියන් රජතුමා ද ඉහත ගණයට වැටේ.

## ❖ මෙසියස් වහන්සේ තුළ බලාපොරොත්තුව

මෙසියස් වහන්සේ පූරණ විමුක්තිය ලබා දේ. එයට ජීවිතයේ සියලු අංග ඇතුළත් වේ. පාපයෙන් පිරුණු ජීවිතය මෙසියස් වහන්සේ තුළින් පූර්ණ විමුක්තිය කරා එළඹේ.

ඌර් ප්‍රදේශයේ සිටි ආබ්‍රම් තම ජීවිත රටාව අත හැර පොරොන්දු දේශයට යොමු වූ ලෙස මෙසියස් වහන්සේ සියලු ජනතාව නව ජීවිතයක් කරා යොමු කරවයි.
(උත්පත්ති 12:13, 22:1518, යෙසායා 9:17, 11:19 )

විදේශ ආක්‍රමණ හා විප්‍රවාසයන්ට ලක් වූ ඊශ්‍රායෙල් ජනතාවට පූර්ණ නිදහසක් ලබා දේ.
(යෙසායා 7:1017, 9:17)




වරින් වර බිහි වූ අය අතර අවි ආයුධ අතට ගත් ආයුධ සන්නද්ධ විප්ලව මඟින් විමුක්තිය ලබා දීමට උත්සාහ කළ අය ද ඇත. නමුත් සැබෑ "මෙසායා" තුළ මෙකී ආක්‍රමණශීලී අවි ආයුධ සහිත මෙසායා ගුණය අඩංගු වී නැත.

## ❖ නව ගිවිසුම තුළ " මෙසායා " / ක්‍රිස්තුස්

සිරියන් අසිරියන් ඊජිප්තු බබිලෝනියා ග්‍රීක හා රෝම අධිරාජ්‍යයනට යටත් වූ ඊශ්‍රායෙලය නව ගිවිසුම් කාලය තුළ දේශපාලනික ලෙස පීඩනයට ලක් ව පැවතිනි.

❖ ශු මාර්ක් 8ඃ27 30 දක්වා පෙනෙන පරිදි ගෝල පිරිස යේසුස් වහන්සේ ම මෙසියස් / ක්‍රිස්තුස් ලෙස හඳුනාගත් බව පෙනේ. එහෙත් 30 වන පදය තුළ හැඟෙන්නේ කුමක් ද?


_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _
_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _
_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _
_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _

ඒ සමඟ ම මෙම කොටසේ අවසානය ශුමාර්ක් 8ඃ3138 දක්වා කොටස් තුළ මෙසියස් පිළිබඳ ජනප්‍රිය අදහස යේසුස් වහන්සේ තුළ තිබූ අදහසින් වෙනස් වන බව පෙනේ.

❖ ශුමාර්ක් 10ඃ3545 ඇති ලෙස යාකොබ් හා යොහන්ගේ ඉල්ලීමට යේයුස් වහන්සේ අවනත නොවන්නේ ඇයි?

_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _
_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _
_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _
_ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _ _

මින් හැඟෙන්නේ යුදෙව් බලාපොරොත්තුව දේශපාලනික මෙසායා කෙනකු මත වුවත් යේසුස් වහනසේ එයට වඩා වෙනස් අදහසකට තම ගෝලයන් ව යොමු කළ බවය.



## ❖ මෙසායා හා මිනිස් වටිනාකම්

1. ශු මතෙව් 1ඃ22, 23 මඟින් මෙසායා, එම්මානුවෙල් හා සම්බන්ධ වන්නේ කෙසේ ද?

-------------------------------------------
-------------------------------------------
-------------------------------------------
-------------------------------------------
-------------------------------------------
-------------------------------------------

2. යෙසායා 11ඃ69 තුළ ඇති චිත්‍රමය ආකාරය ලියන්න.

-------------------------------------------
-------------------------------------------
-------------------------------------------
-------------------------------------------
-------------------------------------------
-------------------------------------------
-------------------------------------------

මේ අය පිළිබඳ ව කරුණු ගොනු කරන්න. එමඟින් ඔවුන් තුළ තිබූ මෙසායනික ගුණාංග ගෙනහැර දක්වන්න.



මහත්මා ගාන්ධි
(1869 1948)



මාටින් ලූතර් කිං
(1929 1968)



ඩියෙට්රිච් බොන්හෝෆර්
(1906 1945)